සියලුම හිමිකම් ඇවිරිණි]All Rights Reserved]

සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර
Department of ExaminationSabaragamuwaDepartment of Examination SabaragamuwaDepartment of Examination SabaragamuwaDepartment of Examination
සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර
Department of ExaminationSabaragamuwaDepartment of Examination SabaragamuwaDepartment of Examination SabaragamuwaDepartment of Examination
සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර

තෙවන වාර පරීක්ෂණය 2024 - 13 ශ්‍රේණිය
Third Term Test – 2024 – Grade 13

ජීව විද්‍යාව - I
Biology - I

පැය දෙකයි.
Two hours

උපදෙස්

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. එන්සයිම ජල විච්ඡේදනයේ දී ග්ලූකෝස් අණු 2ක් පමණක් ලබා දෙනුයේ පහත ඒවායින් කුමක්ද?

(1) සෙලියුලෝස් **(2)** සුක්‍රෝස් **(3)** ලැක්ටෝස්
(4) මෝල්ටෝස් **(5)** පිෂ්ඨය

02. සංයුක්ත ආලෝක අන්වීක්ෂය පිළිබඳව නිවැරදි වන්නේ,

(1) නිදර්ශක වර්ණ ගැන්වීමට බැර ලෝහ භාවිතා කරයි.
(2) නිදර්ශකයේ විශාලනය ලබා දීමට ආලෝක කිරණ පරාවර්තනය වේ.
(3) අවනෙත මගින් සාදන ප්‍රතිබිම්බය උපනෙත මගින් තවදුරටත් විශාලනය කරයි.
(4) $\times$ 600 ක පමණ උපරිම විශාලනයක් ලැබේ.
(5) විභේදන බලය ආලෝකයේ තරංග ආයාමයට අනුලෝමව සමානුපාතික වේ.

03. නියුක්ලියෝටයිඩ හා එහි සංඝටක පිළිබඳව සත්‍ය වන්නේ,

(a) ඇඩිනීන් හා ගුවැනීන් යන නයිට්‍රජනීය භෂ්ම, වළලු දෙකක් සහිතය.
(b) NADPH සහ-එන්සයිමයක් ලෙස ක්‍රියා කරයි.
(c) පොස්ෆේට කාණ්ඩය ආම්ලික ස්වභාවයක් ලබා දෙයි.

(1) a හා b පමණි. **(2)** a හා c පමණි. **(3)** b හා c පමණි.
(4) a පමණි. **(5)** a, b, c පමණි.

04. සෛල ඉන්ද්‍රියිකාව හා එහි කෘත්‍ය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) සිනිඳු අන්තඃප්ලාස්මීය ජාලිකා – කාබෝහයිඩ්‍රේට පරිවෘත්තිය.
(2) පෙරොක්සිසෝම – මේද අම්ල සීනි බවට පරිවර්ථනය.
(3) ගෝල්ගි උපකරණය – ග්ලයිකො ප්‍රෝටීන සංස්ලේෂණය.
(4) රළු අන්තඃප්ලාස්මීය ජාලිකා – පොස්ෆොලිපිඩ හා ස්ටෙරොයිඩ සංස්ලේෂණය.
(5) ලයිසොසෝම – භක්ෂ සෛලිකතාවය මගින් සෛල මිය යෑමට හේතු වීම.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

05. සත්ත්ව සෛලයක් අනුනන විභාජනයේ දී තර්කුව විබහු අවයවීකරණය සිදු වන්නේ,

(1) අන්තර් කලාවේදී ය. **(2)** යෝග කලාවේදී ය. **(3)** වියෝග කලාවේදී ය.

(4) ප්‍රාක් කලාවේදී ය. **(5)** අන්ත කලාවේදී ය.

06. එන්සයිම පිළිබඳව පහත ප්‍රකාශ අතරින් වැරදි වනුයේ,

(1) ඇතැම් ලෝහ අයන සහ සාධක ලෙස ක්‍රියා කරයි.

(2) එන්සයිමයේ ඇති ඇමයිනෝ අම්ල කිහිපයක් එහි සක්‍රිය ස්ථානය සාදයි.

(3) ප්‍රතික්‍රියාවේ සක්‍රියන ශක්තිය අඩු කර එහි සීඝ්‍රතාවය වැඩි කරයි.

(4) නිෂේධක, එන්සයිම උපස්තර සංකීර්ණ සෑදීම වළක්වමින් ප්‍රතික්‍රිය සීඝ්‍රතාවය අඩු කරයි.

(5) ප්‍රතික්‍රියාව සඳහා එන්සයිම වැය වුවද, අන්ත ඵල වල ගුණ හෝ ස්වභාවය වෙනස් නොකරයි.

07. ප්‍රභාසංශ්ලේෂණයේ CO_2 තිර කිරීමේ දී,

(1) ආලෝක ප්‍රතික්‍රියාවේ දී නිපද වූ NADPH ඔක්සිකාරක බලය සපයයි.

(2) සමහර ශාක වල පත්‍ර මධ්‍ය සෛල හා කලාප කොපු සෛල තුළ සිදු වේ.

(3) 3 – PGA කාබෝහයිඩ්‍රේට වල පූර්වග අණු වේ.

(4) රුබිස්කෝ එන්සයිමය PEP කාබොක්සිලේස් එන්සයිමයට වඩා කාර්යක්ෂම වේ.

(5) එක් කැල්වින් චක්‍රයකදී ග්ලූකෝස් අණුවක් නිපද වේ.

08. ප්‍රභාශ්වසනය පිළිබඳව සත්‍ය වගන්තිය තෝරන්න.

(1) RuBP ඔක්සිජනේස් ක්‍රියාවේදී, RuBP ප්‍රතික්‍රියා කරනුයේ CO_2 සමඟිනි.

(2) ඵලයන් ලෙස 3 – PGA අණුවක් හා කාබන් තුනක් සහිත අණුවක් සෑදේ.

(3) ශාකය නිපදවන 3 – PGA ප්‍රමාණය 50% කින් අඩු වන අතර ශුද්ධ CO_2 හානියක් සිදු වේ.

(4) ප්‍රභාශ්වසනය සඳහා හරිතලව, මයිටොකොන්ඩ්‍රියා හා ග්ලයොක්සිසෝම වැදගත් වේ.

(5) C_3 ශාක වල මෙන්ම C_4 ශාක වලද සිදු වේ.

09. ලැක්ටික් අම්ල පැසීම එතිල් මධ්‍යසාර පැසීමෙන් වෙනස් වන්නේ, ලැක්ටික් අම්ල පැසමේදී,

(1) අවසාන හයිඩ්‍රජන් ප්‍රතිග්‍රාහකයා පයිරුවේට් වේ.

(2) CO_2 අණු නිදහස් වේ.

(3) ශුද්ධ ATP ලාභය ලෙස ATP අණු 4ක් ලැබේ.

(4) ඊස්ට් සෛල තුළ බහුලව සිදු වේ.

(5) NADH මඟින් පයිරුවේට් සෘජුවම ඔක්සිකරණය වේ.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

10. පරිනාමය සම්බන්ධව ඉදිරිපත් කළ වාද පිළිබඳව වැරදි වගන්තිය තෝරන්න.

(1) දේහයේ නිතර භාවිතා කරන අවයව ක්‍රමයෙන් විශාලව හා ශක්තිමත්ව වැඩෙන බව ලැමාක් පැවසීය.

(2) ජීවියෙක් ජීවිත කාලය තුළදී පරිසරයට අනුවර්තන ලෙස අත් කරගත් ලක්ෂණ තම ජනිතයන්ට සම්ප්‍රේශණය කිරීම පරිචිත ලක්ෂණ සම්ප්‍රේශනයයි.

(3) නව ඩාවින් වාදය, ස්වාභාවික වර්ණ වාදය, මෙන්ඩලීන ප්‍රවේනිය හා ගහන ප්‍රවේනියේ සමෝධානයකි.

(4) ගහනයක සිටින විවිධ විශේෂ වලට අයත් ජීවීන් අතර ප්‍රවේනික විවිධත්වයක් ඇති බව ඩාවින් නිරීක්ෂණය කළේය.

(5) උචිත ලක්ෂණ දරන ජීවීන් පරිසරයේ නොනැසී පැවතීමට ඉහළ විභවයක් ඇත.

11. බැක්ටීරියා අධිරාජධානියේ ජීවීන්, යුකැරියා අධිරාජධානියේ ජීවීන්ගෙන් වෙනස් වන්නේ, බැක්ටීරියා අධිරාජධානියේ ජීවීන්ගේ,

(1) ප්‍රෝටීන සංශ්ලේෂණයේ ආරම්භක ඇමයිනෝ අම්ලය මෙතියොනින් වීම.

(2) ජාන වල ඉන්ට්‍රෝන ඉතා කලාතුරකින් ඇති නිසාය.

(3) පටල ලිපිඩ ශාකනය නොවූ හයිඩ්‍රොකාබන දාම දරණ නිසාය.

(4) RNA පොලිමරේස එන්සයිම ආකාර බොහෝමයක් ඇති නිසාය.

(5) ප්‍රතිජීවක හමුවේ වර්ධනය නිෂේධනය නොවන නිසාය.

12. ප්‍රොටිස්ටා රාජධානියේ ජීවීන් පිළිබඳව සත්‍ය වනුයේ,

(1) රන්වන් දුඹුරු ඇල්ගී – සංචිත ආහාරය ලැමිනරීන්

(2) *Paramecium* – දේහය වටා ඡවිකාවක් නැති අතර පක්ෂ්ම වලින් වට වී ඇත.

(3) *Sargassum* – සෛල බිත්තියේ ඇල්ජිනික් අම්ලය හා සෙලියුලෝස් ඇත.

(4) රතු ඇල්ගී – ප්‍රභාසංශ්ලේෂක වර්ණක ලෙස ක්ලොරොෆිල් a හා b ඇත.

(5) *Euglena* – සංකෝචක රික්තක හා ආහාර රික්තක ඇත.

13. භෞමික ශාක සියල්ලම,

(1) ශෛලම හා ෆ්ලෝයමය ඔස්සේ ද්‍රව්‍ය පරිවහනය කරයි.

(2) මුල් මඟින් උපස්ථරයට සවි වී පවතී.

(3) විෂමබීජාණුක වේ.

(4) බීජාණු ශාකය ජීවන චක්‍රයේ ප්‍රමුඛ ශාකයයි.

(5) පරාධීන කලලයක් හා බහු සෛලික ජන්මාණුධානි දරයි.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

14. පහත ඒවායින් ව්‍යුහ කෘත්‍ය සම්බන්ධතාවය නිවැරදිව දක්වා ඇත්තේ,

(1) දැඩි කෙඳි - ඇනෙලිඩාවන්ගේ අධිග්‍රහනයට හා සංචරණයට ආධාර කරයි.

(2) පැපුල - ඒකයිනොඩර්මේටාවන්ගේ සංචරණයට ආධාර කරයි.

(3) මැල්පිගිය නාලිකා - ආත්‍රොපෝඩාවන් ශ්වසනයට භාවිතා කරයි.

(4) අංශ පාදික - ඇනෙලිඩාවන් ශ්වසනයට හා සංචරණයට භාවිතා කරයි.

(5) ප්‍රාවරණය - මොලුස්කාවන්ගේ අභ්‍යන්තර අවයව පවත්වා ගනී.

15. ශාක පටක පද්ධති පිළිබඳව පහත ඒවායින් සත්‍ය වනුයේ,

(a) දිලිසෙන සුළු රෝම වැඩිපුර පතිත වන ආලෝකය පරාවර්තනය කරයි.

(b) මෘදුස්තර සෛල වලට සුදුසු තත්ව සපයා දුන් විට විභාජනය වීමේ හැකියාව දරයි.

(c) උපල සෛල වල සුබෙරින් තැන්පත් වීමෙන් සෑදුණු බෙහෙවින් ඝනකම් වූ සෛල බිත්ති ඇත.

(d) වාහකාභ සෛල දිගටි, සිහින්, දෙකෙලවර උල් වූ හැඩයක් ගනී.

(1) a, b, d පමණි. **(2)** a, c, d පමණ. **(3)** b, c, d පමණි.

(4) a, b පමණි. **(5)** b, d පමණි.

16. ද්විබීජ පත්‍රී ශාක කඳ හා ඒකබීජ පත්‍රී ශාක කඳ පිළිබඳව පහත ඒවායින් අසත්‍ය වන්නේ,

	ද්විබීජ පත්‍රී ශාක කඳ	**ඒකබීජ පත්‍රී ශාක කඳ**
01.	සනාල කලාප වල පිටතින් දෘඩස්තර සෛල ගොනුවක් ඇත.	සනාල කලාප වටා දෘඩස්තර සෛල කොපුවක් ඇත.
02.	ද්විතීක වර්ධන ක්‍රියාවලියෙන් වට ප්‍රමාණය වැඩි කරගත හැකිය.	ද්විතීක වර්ධන ක්‍රියාවක් සිදු නොවේ.
03.	පූරක පටකය බාහිකය හා මජ්ජාව ලෙස විභේදනය වී ඇත.	පූරක පටකය බාහිකය හා මජ්ජාව ලෙස විභේදනය වී නැත.
04.	මතුපිට පෘෂ්ඨයේ ඇති කක්ෂීය අංකුර මඟින් පාර්ශ්වික ශාක හට ගනී.	අන්තරස්ථ විභාජක මඟින් පාර්ශ්වික ශාක හට ගනී.
05.	සනාල කලාප වලයක් ලෙස පිහිටයි.	සනාල කලාප පූරක පටකය තුළ විසිරී ඇත.

17. ප්ලෝයම පරිසංක්‍රමණ ක්‍රියාවලිය පිළිබඳව සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) තොග ප්‍රවාහයක් ලෙස සීනි අපායනයේ සිට සීනි ප්‍රභවය දක්වා සිදු වේ.

(2) ප්ලෝයම යුෂයේ සුක්‍රෝස්, ඇමයිනෝ අම්ල, හෝමෝන හා ඛණිජ අඩංගු වේ.

(3) බොහෝ ශාක වල ප්ලෝයම බැර කිරීම සිම්ප්ලාස්ටය ඔස්සේ ප්ලාස්ම බන්ධ හරහා සිදු වේ.

(4) ආකන්ද, බල්බ, කඳන්, අංකුර හා පත්‍ර අපායනය ලෙස ක්‍රියා කරයි.

(5) ප්ලෝයම භර කිරීම බොහෝ ශාක වල සක්‍රීයව සිදු වේ.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

18. විශුන ශාක සෛලයක් සංශුද්ධ ජලයේ ගිල්ල වූ විට සිදුවන ක්‍රියාවලි වල නිවැරදි අනුපිළිවෙළ වනුයේ,

(a) සෛල බිත්තිය පීඩනයට ලක්ව ඇති ප්‍රාක්ප්ලාස්ටය මතට පීඩනයක් ඇති කරයි.

(b) ආස්‍රැතිය මගින් සෛලය තුළට ජලය ඇතුල් වේ.

(c) සෛලයේ ψ_p අගය වැඩි වීමෙන් ψ_p අගය ψ_s අගයට සමාන වේ.

(d) ප්‍රාක්ප්ලාස්ටය ඉදිමීම නිසා ප්ලාස්ම පටලය සෛල බිත්තිය මතට තෙරපවයි.

(1) b, a, d, c **(2)** b, c, d, a **(3)** b, d, a, c
(4) b, d, c, a **(5)** b, a, c, d

19. ශාක පෝෂණය පිළිබඳව අසත්‍ය වනුයේ,

(1) ආලෝකයේ ශක්තිය හා අකාබනික ද්‍රව්‍ය භාවිතයෙන් කාබනික අණු සංශ්ලේෂණය කර ගනී.

(2) කාබන්, හයිඩ්‍රජන්, ඔක්සිජන් වැනි මුල ද්‍රව්‍ය ප්‍රමාණවත්ව නොලැබුණු විට ශාක වල වර්ධනය ඌන වේ.

(3) උසස් ශාක මුල්, දිලීර සමග පෝෂණය සඳහා පාරසරික සම්බන්ධතා ගොඩනගා ගනී.

(4) ශාක වල ජීවන චක්‍රය සම්පූර්ණ කර ගැනීමටත් නව ශාක පරම්පරාවක් නිපදවා ගැනීමටත් මුල ද්‍රව්‍ය 9ක් විශාල ප්‍රමානවලින් අවශ්‍ය වේ.

(5) *Nepenthes, Loranthus, Drosera* ආදි ශාක සමහර පෝෂක සපයා ගැනීමට කෘමීන් ජීර්ණය කරයි.

20. සම්බන්ධක පටක හා අපිච්ඡද පටක යන දෙවර්ගයම,

(1) අවයව හා පටක වල නිදහස් පෘෂ්ඨ ආවරණය කරමින් ඇත.

(2) අවශෝෂණය හා ද්‍රව්‍ය පරිවහනය කෘත්‍යය ඉටු කරයි.

(3) ආරක්ෂක කෘත්‍ය ඉටු කරයි.

(4) පුරකයක්, සෛල හා තන්තු වලින් සමන්විතයි.

(5) දේහ අවයව වලට ශක්තිය හා සුනම්‍යතාවය සපයයි.

21. මිනිසාගේ අක්මාව පිළිබඳව සත්‍ය වනුයේ,

(1) ෂඩස්‍රාකාර හැඩැති ඉතා කුඩා අනුඛණ්ඩිකා වලින් සැදුණු ඛණ්ඩිකා 3ක් ඇත.

(2) අණු කණ්ඩිකා, වල කෝණ වල යාකෘතික ධමනි ශාකාවක්, යාකෘතික ප්‍රතිහාර ශිරා ශාකාවක්, අන්තර් අනුඛණ්ඩිකා පිත්ත ප්‍රනාලයක් ඇත.

(3) කෝටරාභ වල ආස්තරණයේ භක්ෂක සෛලතාවයට වැදගත් වන කුපර් සෛල ඇත.

(4) පෝශක ද්‍රව්‍ය බහුල ධමනි රුධිරය හා ශිරා රුධිරය මිශ්‍රණයක් කෝටරාබ තුළ ඇත.

(5) මේද ද්‍රාව්‍ය විටමින හා ජල ද්‍රාව්‍ය විටමිනයක් වන B_9 ගබඩා කරයි.

22. මිනිසාගේ මහා අන්ත්‍රය මඟින් ඉටු කරන කෘත්‍යයක් වනුයේ,

(1) බැහැර කරන තුරු මල ද්‍රව්‍ය ගබඩා කිරීම. **(2)** මේද ද්‍රාව්‍ය විටමින සංශ්ලේෂණය.

(3) ජලය අවශෝෂණය සම්පූර්ණ කිරීම. **(4)** ආහාර ජීර්ණය සම්පූර්ණ කිරීම.

(5) සික්‍රටීන් නිපදවා ස්‍රාවය කිරීම.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

23. මානව රුධිර සංසරණ පද්ධතියේ,

(1) ධමනි, සෑම විටම ඔක්සිජන් පෝෂිත රුධිරය රැගෙන යයි.

(2) හෘදයේ දකුණු කෝෂිකා බිත්තිය වම් කෝෂිකා බිත්තියට වඩා ඝනකමින් වැඩි ය.

(3) කර්ණික කෝෂික ගැටය හෘත් ගතිකරයයි.

(4) හෘත් රජ්ජු කර්ණික කෝෂික කපාට නොපිට පෙරලීම වළකයි.

(5) මහා ධමනි කපාටයට වහාම පෙර කිරීටක ධමනි යුගල හට ගනී.

24. මිනිසාගේ පෙනහැලි වාතනය වීමේ යන්ත්‍රණය පිළිබඳව අසත්‍ය වනුයේ,

(1) ප්‍රාශ්වාසයේ දී ප්‍රාචීර පේශී හා අන්තර් පර්ශුක පේශි ඉහිල් වේ.

(2) ගැඹුරු ශ්වසනය සඳහා ගෙල, පිට ප්‍රදේශය හා පපු ප්‍රදේශයේ මාංසපේශී ද දායකත්වය සපයයි.

(3) මිනිසාගේ ආශ්වාසයේ දී පෙනහැලි තුලට වාතය තල්ලු වීමක් වන බැවින් ඍණ පීඩන ශ්වසනයක් සිදුවේ.

(4) ශ්වසන ක්‍රියාවලිය නිසි ලෙස හැසිරවීමට අදාළ අතිරේක ස්නායු පරිපථ වැරෝලි සේතුව් ඇත.

(5) ආශ්වාසයේ දී ශක්තිය වැය කරමින් පර්ශුක පේශී හා ප්‍රාචීර පේශී සංකෝචනය වේ.

25. පහත ජීවී ආකාර වල හමුවන බහිස්‍රාවී ව්‍යුහ අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(a) ඇනෙලීඩාවන් **(b)** කරදිය පක්ෂීන් **(c)** කෘමීන් **(d)** ක්‍රස්ටේෂියාවන්

(1) වෘක්කිකා, මැල්පිගිය නාලිකා, ලවණ ග්‍රන්ථි, ස්පර්ශක ග්‍රන්ථි

(2) වෘක්කිකා, ලවණ ග්‍රන්ථි, මැල්පිගිය නාලිකා, ස්පර්ශක ග්‍රන්ථි

(3) මැල්පිගිය නාලිකා, ලවණ ග්‍රන්ථි, ස්පර්ශක ග්‍රන්ථි, වෘක්කිකා

(4) වෘක්කිකා, ලවණ ග්‍රන්ථි, ස්පර්ශක ග්‍රන්ථි, මැල්පිගිය නාලිකා,

(5) වෘක්කිකා, මැල්පිගිය නාලිකා, ස්පර්ශක ග්‍රන්ථි, ලවණ ග්‍රන්ථි

26. මානව ස්නායු ප්ධතියේ,

(1) අනුවේගී හා ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධති සටන් වැදීම හෝ පලායෑම සඳහා දේහය සූදානම් කරයි.

(2) පර්යන්ත ස්නායු පද්ධතියේ චාලක පද්ධතිය අනිච්ඡානුග දේහ ක්‍රියා පාලනය කරයි.

(3) ප්‍රත්‍යානුවේගී පද්ධතියේ ස්නායු සම්ප්‍රේෂකය නෙඑපිනෙප්‍රීන් වේ.

(4) අක්සනයක් ඔස්සේ ගමන් කරන ක්‍රියා විභවයක් ස්නායු ආවේගයක් ලෙස සලකයි.

(5) රසායනික හා විද්‍යුත් ආවේග සම්ප්‍රේශනයක් සිදුවන අතර ස්ථානීයව ප්‍රතිචාර දක්වයි.

27. මානව සමෙහි කෘත්‍යයක් නොවන්නේ,

(1) යූරියා බහිස්‍රාවය **(2)** දේහ උෂ්ණත්ව යාමනය

(3) චර්මීය සංවේදීතාවය **(4)** පැන්ටොතෙනික් අම්ලය සංශ්ලේෂණය

(5) විජලනයට එරෙහිව ආරක්ෂාව

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

28. හයිපොතැලමස මගින් රුධිර ධාරාවට නිදහස් කරන හෝමෝනයක් නොවන්නේ,

(1) GHRH **(2)** PRH **(3)** ADH **(4)** GHRIH **(5)** CRH

29. මානව ක්ෂීරණයේ දී ක්‍රියාකාරී වන ධන ප්‍රතිපෝෂී යන්ත්‍රණයේ පියවර අනුපිළිවෙල වනුයේ,

(1) අපර පිටියුටරයි → රුධිරයට ඔක්සිටොසීන් මුදා හැරීම → ස්ථාන ග්‍රන්ථි වල සිනිඳු පේශී සංකෝචනය → කිරි විසර්ජනය → ළදරුවා කිරි උරා බීම → සංවේදක නියුරෝන

(2) ළදරුවා කිරි උරාබීම → සංවේදක නියුරෝන → අපර පිටියුටරිය → රුධිරයට ඔක්සිටොසීන් මුදා හැරීම → ස්ථාන ග්‍රන්ථිවල සිනිඳු පේශී සංකෝචනය → කිරි විසර්ජනය

(3) ස්තන ග්‍රන්ථිවල සිනිඳු පේශී සංකෝචනය → කිරි විසර්ජනය → ළදරුවා කිරි උරා බීම → සංවේදක නියුරෝන → අපර පිටයුටරිය → රුධිරයට ඔක්සිටොසීන් මුදා හැරීම.

(4) කිරි විසර්ජනය → ළදරුවා කිරි උරා බීම → සංවේදක නියුරෝන → අපර පිටියුටරිය → රුධිරයට ඔක්සිටොසීන් මුදා හැරීම → ස්ථන ග්‍රන්ථිවල සිනිඳු පේශී සංකෝචනය

(5) රුධිරයට ඔක්සිටොසීන් මුදා හැරීම → ස්ථන ග්‍රන්ථි වල සිනිඳු පේශී සංකෝචනය → කිරි විසර්ජනය → ළදරුවා කිරි උරා බීම → සංවේදක නියුරෝන → අපර පිටියුටරිය

30. පහත ඒවායින් සත්‍ය වනුයේ,

(1) පාකින්සන්ස් රෝගය - පේශී චලන සමායෝජනය හා පාලනය නැති වී යාම.

(2) අස්ථි පර්වදාහය - අස්ථි තැන්පත් වීමේ වේගය ඉක්මවා අස්ථි ප්‍රතිශෝෂණය වීම.

(3) විශාදය - සැබෑ තත්වයට වඩා විකෘති වූ සංජානනයන් සහිත ලාක්ෂණික මනෝ ව්‍යාධික තත්වය

(4) මධු මේහය II - ඉන්සියුලින් ස්‍රාවය ප්‍රභල ලෙස ඌන වීම හෝ නැති වී යාම.

(5) ඇල්ශයිමර් රෝගය - දොම්නසට පත් ස්වභාවයක් පෙන්වීම.

31. ශාකයක රතු පුෂ්ප (R), සුදු පුෂ්ප (r) වලට ප්‍රමුඛ වේ. කළු බීජ (B), දුඹුරු බීජ (b) වලට ප්‍රමුඛ වේ. රතු පුෂ්ප කළු බීජ දරන ශාකයක්, සුදු පුෂ්ප දුඹුරු බීජ දරන ශාකයක් සමග මුහුම් කළ විට ලැබුණු ප්‍රජනිතයේ රතු පුෂ්ප කළු බීජ දරන ශාක 50% ක් හා සුදු පුෂ්ප කළු බීජ දරන ශාක 50% ක් ඇති විය. ජනක ශාකවල ප්‍රවේනි දර්ශ වනුයේ,

(1) RRBB × rrbb **(2)** RRBb × rrbb **(3)** RrBB × rrbb

(4) RrBb × rrbb **(5)** RrBb × Rrbb

32. විකෘති පිළිබඳව පහත ඒවායින් සත්‍ය වනුයේ,

(1) ලක්ෂ විකෘතියක් නිසා ඇමයිනෝ අම්ලයකට කේත සපයන කෝඩෝනයක් නැවතුම් කෝඩෝනයක් බවට පත්වීමෙන් අනර්ථදායි ප්‍රෝටීන සෑදේ.

(2) එක් වර්ණක දේහයක කොටසක් එහි සමජාත වර්ණදේහයට මාරු වීම පරිසංක්‍රමණය ලෙස හඳුන්වයි.

(3) විකෘතියක් හේතුවෙන් පොලිපෙප්ටයිඩයක ප්‍රාථමික ව්‍යුහයේ අර්ථය මඳ ලෙස වෙනස් වීම නිසා අපගතාර්ථක විකෘති ඇති වේ.

(4) නියුක්ලියෝටයිඩ යුගල එකක් හෝ වැඩි ගණනක් එකතු වීම ''ආදේශය'' ලෙස හඳුන්වයි.

(5) සෛලයක වර්ණදේහ එකක් අඩුවෙන් හෝ වැඩිපුර පැවතීම බහුගුණකතාව ලෙස හඳුන්වයි.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

33. ප්‍රතිසංයෝජිත DNA අණුවක් සකසා ගැනීමේ දී අනුගමනය කරන පහත ක්‍රියාවලි නිවැරදි අනුපිළිවෙළට සකසන්න.

(a) ජෙල විද්‍යුතාගමනයෙන් DNA කණ්ඩ වෙන් කිරීම.

(b) වෙනස් ප්‍රභව වලින් DNA විසංගමනය

(c) ඒෂණ භාවිත කරමින් අවශ්‍ය නියුක්ලියෝටයිඩ අනුපිළිවෙළ සහිත නිවැරදි ඛණ්ඩ හඳුනා ගැනීම.

(d) බහුවිධ ප්‍රභව වලින් ලබාගත් DNA ඛණ්ඩ DNA ලයිගේස් භාවිතා කරමින් සම්බන්ධ කිරීම.

(e) විසංගත DNA සීමා එන්සයිම මගින් සීමිත ජීර්ණය

(1) b, e, c, a, d **(2)** b, a, e, c, d **(3)** b, a, c, e, d
(4) b, e, a, c, d **(5)** b, c, e, a, d

34. සත්‍ය ගැළපීම තෝරන්න.

(1) දූලා - ඒක දේශීය විශේෂයකි.
(2) ලාම්පු බෙල්ලා - මූලස්ථාන විශේෂයකි.
(3) අලියා - අන්තරායට ලක් විය හැකි විශේෂයකි.
(4) රබර් - දේශීය විශේෂයකි.
(5) මහමඩු - අතිශය අන්තරායට ලක් වූ ශාකයකි.

35. කියෝතෝ සම්මුතිය,

(1) ක්‍රියාන්විත මගින් හෝ අහම්බෙන් හෝ නැවු මගින් වන සාගර පරිසර දූෂණය වැලැක්වීමට ඇති කරගත් සම්මුතියයි.

(2) අන්තරායට ලක් වූ ශාක හා සත්ත්ව විශේෂ වල අන්ර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතියයි.

(3) දේශගුණික විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියයි.

(4) ඕසෝන් ස්ථරය ආරක්ෂා කර ගැනීමට ඇති කරගත් අන්තර්ජාතික සම්මුතියයි.

(5) අනතුරුදායක අපද්‍රව්‍ය දේශසීමා හරහා පරිවහනය හා බැහැර කිරීම පාලනයට ඇති කරගත් සම්මුතියයි.

36. පාරිසරික බියෝම පිළිබඳව පහත ඒවායින් සත්‍ය වනුයේ,

(1) නිවර්තන වැසි වනාන්තරවල සදාහරිත ශාක ඇති අතර වියළි වනාන්තරවල සමහර ශාකවල පත්‍ර වියලි කාලයේ දී හැලේ.

(2) මිටි තෘණ ශාක වැස්මක් තුළ විසිරුණු ශාක පැවතීම සැවානා වලට ලාක්ෂණික වේ.

(3) කුරු වනාන්තර හා ඒවා අතර පැතිරුණු කාෂ්ඨීය පැළෑටි වලින් චපරාල් සමන්විත වේ.

(4) මිටි තෘණ ප්‍රෙයරි තෘණ භූමි අන්තරායට ලක් වූ ස්වභාවික පරිසර පද්ධතියකි.

(5) ආක්ටික් තුන්ද්‍රා ඉහළ උන්නතාංශ වල හමුවේ.

37. ශක්ති ප්‍රභවය ලෙස ආලෝකය හා කාබන් ප්‍රභවය ලෙස කාබනික කාබන් භාවිතා කරමින් පෝෂණය සපයා ගන්නා ජීවියා වනුයේ,

(1) *Nitrosomonas* **(2)** දම් සල්ෆර් නොවන බැක්ටීරියා
(3) බොහෝ බැක්ටීරියාවන් **(4)** දම් සල්ෆර් බැක්ටීරියාවන්
(5) හරිත සල්ෆර් බැක්ටීරියාවන්

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

38. මොලිකියුටයිස් පිළිබඳව හොඳින්ම විස්තර කරනුයේ,

(1) ගෝලාකාර සිට සූත්‍රිකාර දක්වා විවිධ හැඩයන්ගෙන් යුතු ශාක වල ප්ලෝයම යුෂයේ හමුවන ජීවී කාණ්ඩයකි.

(2) ද්විඛණ්ඩනයෙන් ප්‍රජනනය සිදු කරන සූත්‍රිකාර හැඩයෙන් යුතු නිර්වායු හෝ වෛකල්පිත නිර්වායු ප්‍රාග්න්‍යෂ්ටිකයන්ය.

(3) ගෝලාකාර සිට සූත්‍රිකාකාර දක්වා විවිධ හැඩයෙන් යුතු ආලෝක අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කළ නොහැකි සෛල බිත්ති දරන ප්‍රාග්න්‍යෂ්ටිකයන්ය.

(4) පත්‍ර කීඩැවන්ගේ දේහ තුළ, ශාක දේහ තුළ හා මිනිසා ඇතුළු වෙනත් සතුන්ගේ දේහ තුළ සහභෝජීව ජීවත් වන ප්‍රාග්න්‍යෂ්ටිකයන්ය.

(5) ගෝලාකාර සිට සූත්‍රිකාර දක්වා විවිධ හැඩයෙන් යුතු, ආලෝක අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කළ නොහැකි, සෛල බිත්ති නොදරන, බැක්ටීරියා අධිරාජධානියට අයත් ප්‍රාග්න්‍යෂ්ටිකයන්ය.

39. මිනිසාගේ ස්නායු පද්ධතිය ආශ්‍රිත රෝග ඇති කිරීම හේතු වන ක්ෂුද්‍ර ජීවීන් වනුයේ,

(a) *Neisseria meningitidis*
(b) *Streptococcus pneumnoia*
(c) *Streptococcus pyogenes*
(d) *Leptospira interrogans*
(e) *Heamophilus influenzae*

(1) a, c, e පමණි. **(2)** a, d, e පමණි. **(3)** a, b, e පමණි.
(4) a, c, d පමණි. **(5)** b, d, e පමණි.

40. ජල ජීව වගාව සම්බන්ධයෙන් අසත්‍ය වගන්තිය තෝරන්න.

(1) සුදුසු කළමනාකරණ පිළිවෙත් අනුගමනය කර මසුන්ගේ ප්‍රතිශක්තිය ඉහළ මට්ටමක තබා ගැනීමෙන් බොහෝ ආසාධක රෝග වළක්වා ගත හැකිය.

(2) ජලාලය තුළ කාබනික ද්‍රව්‍ය එකතුවීමට මසුන්ගේ අධික බහාලුම් ඝනත්වය හේතුවක් වේ.

(3) Tiger barb වැනි මසුන් සංරක්ෂණයට විසිතුරු මත්ස්‍ය වගාව දායක වී ඇත.

(4) මසුන්ට වැළඳෙන රක්තපාත සෙප්ටිසීමියා රෝගයේ රෝග කාරකයා දිලීරයකි.

(5) ජලාලයට වැඩිපුර ආලෝකය ලැබෙන විට එහි හරිත ඇල්ගී වර්ධනය වේ.

■ **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට දී ඇති ප්‍රතිචාර අතුරින් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ නිවැරදියි. කවර ප්‍රතිචාරය / ප්‍රතිචාර නිවැරදිද යන්න පලමුවෙන්ම විනිශ්චය කරගන්න. ඉන්පසු නිවැරදි අංකය තෝරන්න.**

(1)	(2)	(3)	(4)	(5)
A,B,D නිවැරදියි.	A,C,D නිවැරදියි.	A,B නිවැරදියි.	C,D නිවැරදියි.	වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් හෝ නිවැරදියි.

41. පහත වගන්ති අතරින් සත්‍ය වගන්තිය / වගන්ති තෝරන්න.

(A) මෝල්ටෝස්, බෙනඩික් පරීක්ෂාවේ දී ගඩොල් රතු පාට අවක්ෂේපයක් ලබා දේ.

(B) ඇල්බියුමීන්, බයියුරේට් පරීක්ෂාවේ දී දම් පාටක් ලබා දේ.

(C) සුක්‍රෝස්, බයියුරේට් පරීක්ෂාවේ දී දම් පාටක් ලබා දේ.

(D) ග්ලූකෝස්, බෙනඩික්ස් පරීක්ෂාවේදී දම් පාටක් ලබා දේ.

(E) පොල් තෙල්, සුඩාන් III පරීක්ෂාවේ දී නිල්පාට හේද ගෝලිකා ලබා දේ.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

42. ප්‍රභාසංශ්ලේෂණයේ ආලෝක ප්‍රතික්‍රියාව පිළිබඳව සත්‍ය වගන්තිය / වගන්ති තෝරන්න.

(A) ප්‍රභා පද්ධති II හි ප්‍රතික්‍රියා මධ්‍යස්ථානයේ ඇති ක්ලෝරොෆිල් a අණු තරංග ආයාමය 700 nm වන ආලෝක තරංග ඵලදායිව අවශෝෂණය කරයි.

(B) ප්‍රභාපොස්පොරයිලීකරණයෙන් හා ඔක්සිකාරක පොස්පොරයිලීකරණයෙන් ATP නිපද වේ.

(C) චක්‍රීය ඉලෙක්ට්‍රෝන ගලනයේ දී ATP සෑදෙන අතර NADPH හා O_2 නිදහස් නොවේ.

(D) C_4 ශාකවල පත්‍ර මධ්‍ය සෛල හරිතලව ආලෝකය මත රඳා පවතින ප්‍රතික්‍රියාවට අනුවර්තන පෙන්වයි.

(E) රේඛීය ඉලෙක්ට්‍රෝන ගලනයේ දී ප්‍රභා පද්ධති II හි ප්‍රභාසංශ්ලේෂක වර්ණක හා වෙනත් අණුක සංඝටක ඔස්සේ ඉලෙක්ට්‍රෝන එක් දිශාවකට ගැලීම සිදුවේ.

43. සමබීජාණුකතාවය පෙන්වන බීජ රහිත ශාක වනුයේ,

(A) *Nephrolepis* **(B)** *Selaginella* **(C)** *Lycopodium*

(D) *Pogonatum* **(E)** *Cycus*

44. ක්ලෝරොෆිල් සංශ්ලේෂණයට වැදගත්වන ශාක පෝෂකය / පෝෂක වනුයේ,

(A) Fe **(B)** Zn **(C)** Ca **(D)** Mg **(E)** Cu

45. කුඩා අන්ත්‍රය තුළදී වන ආහාරයේ රසායනික ජීර්ණ ක්‍රියාවලිය පිළිබඳව නිවැරදි වගන්තිය / වගන්ති තෝරන්න.

(A) ට්‍රයිග්ලිසරයිඩ $\xrightarrow[\text{ලයිපේස්}]{\text{අග්න්‍යාශයික}}$ ග්ලිසරෝල් + මේද අම්ල + මොනොග්ලිසරයිඩ

(B) කුඩා පෙප්ටයිඩ $\xrightarrow{\text{කාබොක්සිපෙප්ටයිඩේස්}}$ ඇමයිනෝ අම්ල

(C) වඩාත් කුඩා පොලිපෙප්ටයිඩ $\xrightarrow[\text{ඩයිපෙප්ටයිඩේස්}]{\text{අග්න්‍යාශයික}}$ කුඩා පෙප්ටයිඩ + ඇමයිනෝ අම්ල

(D) RNA $\xrightarrow[\text{නියුක්ලියේස්}]{\text{අග්න්‍යාශයික}}$ නියුක්ලියෝටයිඩ

(E) නියුක්ලියෝටයිඩ $\xrightarrow{\text{නියුක්ලියේස්}}$ නයිට්‍රජනීය භෂ්ම + පෙන්ටෝස් සීනි + පෝස්ෆේට්

46. මිනිසාගේ රුධිර ග්ලූකෝස් මට්ටම යාමනයට වැදගත්වන හෝමෝනය / හෝමෝන වනුයේ,

(A) ඉන්සියුලින් **(B)** ග්ලූකගොන් **(C)** ඇල්ඩොස්ටෙරෝන්

(D) ඇඩ්‍රිනලීන් **(E)** කෝටිසෝල්

47. මානව ලිංග ප්‍රතිබද්ධ ආබාධ වනුයේ,

(A) හිමොෆීලියාව **(B)** වර්ණාන්ධතාවය **(C)** ඩවුන්ස් සහ ලක්ෂණය

(D) දෑකැති සෛල රෝගය **(E)** ඇල්කැප්ටොනියුරියාව

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

48. ශ්‍රී ලංකාවේ තෙත්බිම් පරිසර පද්ධති සම්බන්ධව සත්‍ය වගන්තිය / වගන්ති තෝරන්න.

(A) පහත රට වියළි කලාපයේ වැව් බහුලව ඇත.

(B) මතුපිට ගලා යන ජලය හෝ භූගත ජල කාන්දු වීම් වලින් සෑම විටම අභ්‍යන්තර මිරිදිය වගුරු බිම් වලට ජලය ලැබේ.

(C) කලපුවක් මුහුදෙන් වෙන් කරමින් සාමාන්‍යයෙන් වැලි බාදකයක් ඇත.

(D) ''කටු ඉකිලිය'' කඩොලාන ආශ්‍රිත ශාකයකි.

(E) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ හා ශුෂ්ක කලාපයේ වෙරළබඩ ප්‍රදේශවල ලවණ වගුරු හමු වේ.

49. ක්ෂුද්‍ර ජීවීන් මගින් ආහාර නරක් වීමේ දී,

(A) මුඩු වීමේදී, මේද අම්ල → ග්ලිසරෝල් බවට පරිවර්තනය වේ.

(B) පැසීමේ දී, සීනි → මධ්‍යසාර හා වායු වර්ග බවට පරිවර්තනය වේ.

(C) පූතිභවනයේ දී, ඇමයිනෝ අම්ල → මේද අම්ල හා ඇමෝනියා බවට පරිවර්තනය වේ.

(D) පෝෂක වලින් සරු ආහාර පහසුවෙන් නරක් වේ.

(E) දෙහි, දොඩම්, කෙසෙල් වැනි පලතුරු බැක්ටීරියා හා යීස්ට් මගින් පහසුවෙන් නරක් වේ.

50. පහත ඒවායින් සත්‍ය වගන්තිය / වගන්ති තෝරන්න.

(A) ව්‍යාධිජනක ක්ෂුද්‍ර ජීවීන් ධාරක සෛල ආක්‍රමණය කිරීමට පොස්පොලයිපේස්, ලෙසිතිනේස් හා හයලුරොනිඩේස් වැනි බහිඃසෛලීය පොලිසැකරයිඩ සංයෝග දරයි.

(B) මිනිසාට ක්ෂුද්‍ර ජීවීන් මගින් වැළඳෙන රෝග පාලනයට ව්‍යාසාධක මිනිස් දේහයට ආරක්ෂාකාරීව හා ඍජුව යෙදිය හැකිය.

(C) ධූලකාභ එන්නත් වල ප්‍රතිශක්තිය ප්‍රේරණය කළහැකි ව්‍යාධිජනකයාගේ ප්‍රතිදේහජනක කණ්ඩ පමණක් අඩංගු වේ.

(D) භෝග වගා පද්ධති වල N හා P වල ජෛව ප්‍රයෝජ්‍යභාවය ඉහළ නැංවීමට භාවිතා කල හැකි ක්ෂුද්‍ර ජීවීන් ''ජෛව පොහොර'' ලෙස හඳුන්වයි.

(E) ස්වභාවික ජලාශ වලට අප ජලය විශාල ප්‍රමාණවලින් මුදා හැරීම නිසා ඒවායේ ජෛව ඔක්සිජන් ඉල්ලුම පහළ යයි.

***

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

සියලුම හිමිකම් ඇවිරිණි [All Rights Reserved]

සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්
Department of ExaminationSabaragamuwaDepartment of Examination SabaragamuwaDepartment of Examination SabaragamuwaDepartment of Examination
සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්
Department of ExaminationSabaragamuwaDepartment of Examination SabaragamuwaDepartment of Examination SabaragamuwaDepartment of Examination
සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්

තෙවන වාර පරීක්ෂණය 2024 - 13 ශ්‍රේණිය
Third Term Test – 2024 – Grade 13

ජීව විද්‍යාව - II
Biology - II

පැය දෙකයි.
Two hours

වැදගත් :
- ❉ මෙම ප්‍රශ්න පත්‍රය පිටු 12 කින් යුක්ත වේ.
- ❉ මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යන කොටස් දෙකකින් යුක්ත වේ. කොටස් දෙකටම නියමිත කාලය පැය තුනකි

A කොටස – ව්‍යුහගත රචනා

(පිටු 11 කි)

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න. ඔබේ පිළිතුරු පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතුය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

B කොටස – රචනා

(පිටු 01 කි)

ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු “A” සහ “B” කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ “A” කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාරදෙන්න.

ප්‍රශ්න පත්‍රයේ ”B” කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

පරීක්ෂකයාගේ ප්‍රයෝජනය සඳහා පමණි.

දෙවැනි පත්‍රය සඳහා		
කොටස	ප්‍රශ්න අංක	ලැබූ ලකුණු
A	1	
	2	
	3	
	4	
B	5	
	6	
	7	
	8	
	9	
	10	
එකතුව		
ප්‍රතිශතය		

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරින්	

සංකේත අංකය

උත්තර පත්‍ර පරීක්ෂක	
ලකුණු පරීක්ෂා කළේ	1.
	2.
අධීක්ෂණය	

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

(A) කොටස - ව්‍යුහගත රචනා

- **සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

01. (A) (i) පහත ඒවා හඳුන්වන්න.

(a) තිරසර ආහාර නිෂ්පාදනය,

....

....

(b) ප්‍රජනනය ....

....

(ii) (a) ඉන්ද්‍රියිකාවක් යනු කුමක් ද?

....

....

....

(b) සුන්‍යෂ්ඨික සෛල වල චක්‍රිය DNA හමුවන ස්ථානයක් ලියන්න.

....

(iii) (a) ශාක සෛලයක හා සත්ව සෛලයක සෛල ප්ලාස්ම විභාජනයේ වෙනස්කමක් දක්වන්න.

....

....

(b) ශාක වල ගඬු කාරක ලෙස ක්‍රියාකරන ක්ෂුද්‍ර ජීවින් නොවන ජීවින් ආකාරයක් ලියන්න.

....

(iv) (a) සෛල තුල නිර්වායු ශ්වසනයේ දී ATP නිපදවන ආකාරය ලියන්න.

....

(b) එන්සයිමීය ක්‍රියා යාමනයේ දී, යාමක අණු එන්සයිමය හා බැඳෙන විශිෂ්ඨ ස්ථානය කුමක් ද?

....

(c) සහ එන්සයිමයකට උදාහරණයක් ලියන්න.

....

(v) එන්සයිම ක්‍රියාවේ ප්‍රේරික සීහුම් යන්ත්‍රණය සැකෙවින් දක්වන්න.

....

....

....

....

....

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(B) (i) (a) ප්‍රභා පද්ධතියක ප්‍රධාන කොටස් මොනවා ද?

....

....

(b) ප්‍රභාසංශ්ලේෂණයේ අවශෝශක වර්ණාවලිය යන්න හඳුන්වන්න.

....

....

(c) C_3 ශාක ප්‍රභාසංශ්ලේෂණයේ දී භාවිතා වන එන්සයිම 2 ක් නම් කරන්න.

....

....

(ii) (a) ප්‍රභාශ්වසනයේ දී වැදගත්වන තනි පටල ආවරණයක් සහිත ඉන්ද්‍රියිකාව කුමක් ද?

....

(b) සීමාකාරී සාධක මූල ධර්මය ලියන්න.

....

....

(iii) ග්ලූකෝස් අණුවක් ස්වායු ශ්වසනයට ලක්වන ක්‍රියාවලියේ ප්‍රතික්‍රියා පියවර පහත දැක්වේ.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

(a) x, y, z හඳුනා ගන්න.

x - ....

y - ....

z - ....

(b) ඉහත ක්‍රියාවලියේ දී සයිටොසොලය තුල නිපදවන ATP අණු ගණන කොපමණ ද?

....

(c) මයිටොකොන්ඩ්‍රියා පුරකය තුල දී නිපදවන NADH අණු ගණන කොපමණ ද?

....

(iv) ආකියා හා යුකැරියා අධිරාජධානි වල ජීවින්ගේ හමුවන සමානතා 2 ක් ලියන්න.

....

....

(C) (i) (a) වංශය – ඇස්කොමයිකෝටා වල ලිංගික බීජානු ආකාරය කුමක් ද?

....

(b) වල ප්‍රජනක ව්‍යුහ සාදන දිලීරයක ගන නාමය ලියන්න.

....

(ii) (a) දිලීර වල ශෝෂක වල කෘත්‍යයක් ලියන්න.

....

(b) *Agaricus* ලිංගික ප්‍රජනනයේ දී සාදන එලාවරණය කුමක් ද?

....

(iii) (a) පරිනාමික වඩාත් දියුණු විනාල ශාක වංශය කුමක් ද?

....

(b) ගඳා පාසි හා ශුකි පාසි ශාක වල ජීවන චක්‍රයේ ප්‍රධාන වෙනස්කමක් ලියන්න.

....

(iv) (a) බීජ ශාක වල වැදගත් ලක්ෂණ දෙකක් ලියන්න.

....

....

(b) ඇන්තොෆයිටා වංශයේ ශාක වලට අනන්‍ය ලක්ෂණ 2 ක් ලියන්න.

....

....

(c) පරාගකණිකා බිත්තියේ හමුවන බහුඅවයවිකය දක්වන්න.

....

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

02. (A) (i) (a) පරාගනය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

....

....

(b) ආවෘත බීජක ශාක පරපරාගනයට පෙන්වන විශේෂ අනුවර්තන දෙකක් ලියන්න.

....

....

(c) බීජයක ඇති පහත ව්‍යුහ වල වැදගත්කමක් බැගින් ලියන්න.

- බීජාවරණය - ....
- සංචිත ආහාර - ....

(ii) පහත ඒවායේ කෘත්‍යයක් බැගින් ලියන්න.

(a) කේසර වැනි ට්‍රිකෝම ....

(b) මූල කේෂ ....

(iii) (a) ද්විතීක වර්ධනයේ දී සෑදෙන සනාල කිරණ වල කෘත්‍යයක් ලියන්න.

....

(b) ගිම්හාන කාෂ්ඨයෙන් ශාකයට ලැබෙන වැදගත්කම කුමක් ද?

....

(iv) (a) පූටිකා ක්‍රියාකාරීත්වයට බලපාන සාධක 2 ක් ලියන්න.

....

....

(b) පූර්ණ පරපෝෂී ශාකයක ගණ නාමය ලියන්න.

....

(B) (i) ශාක පෙන්වන පහත සඳහන් ප්‍රතිචාර ආකාර හඳුන්වන්න.

(a) නිදිකුම්බා ශාක, පත්‍රිකා හැකිලීම. ....

(b) ආරෝහක ශාක වල පහුරු ආධාරකය වටා සීඝ්‍රයෙන් එතීම.

....

(c) ශාක මූල පොළව දෙසට වර්ධනය වීම. ....

(ii) (a) බීජ පැල වල ත්‍රිත්ව ප්‍රතිචාර ලියන්න.

....

....

....

(b) පහත කෘත්‍ය ඉටුකර ශාක වර්ධක යාමකයක් ලියන්න.

- බීජ විකසනය හා ප්‍රරෝහනය උත්තේජනය ....
- අපායක පටකවලට පෝෂක චලනය දිරි ගැන්වීම. ....
- බීජ සුප්තතාවය දිරිගැන්වීම. ....

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(iii) නියං ආතති වලදී ශාක වල ශාක වල පැවැත්ම තහවුරු කර ගැනීමට පෙන්වන අනුවර්ත 2 ක් ලියන්න.

....

....

(iv) (a) ජෛව ආතති යනු මොනවා ද?

....

....

(b) ජෛව ආතති වලින් ආරක්‍ෂා වීමට පෙර සිට පැවත එන ව්‍යුහමය ආරක්‍ෂන 2 ක් ලියන්න.

....

....

(C) (i) පහත ව්‍යුහ හමුවන සත්ව වංශයක් ලියන්න.

(a) රේත්‍රිකාව ....

(b) ශ්වසනරුක් ....

(c) අංශපාදිකා ....

(ii) වර්ගය - Aves හා වර්ගය - Mammalia ජීවින්ට පොදු ව්‍යුහමය ලක්‍ෂණයක් හා කායකර්මීය ලක්‍ෂණයක් බැගින් ලියන්න.

- ව්‍යුහමය ලක්‍ෂණය ....
- කායකාර්මීය ලක්‍ෂණය ....

(iii) (a) කාටිලේජ පූරකයේ හමුවන ප්‍රෝටීන, කාබෝහයිඩ්‍රේට සංකීර්ණය ලියන්න.

....

(b) කංකාල පේශි සෛලයක හා හෘත් පේශි සෛලයක හමුවන ව්‍යුහමය වෙනස්කමක් ලියන්න.

....

(c) ස්නායු පටකයේ හමුවන සෛල ආකාර 2 ක් ලියන්න.

....

(iv) පහත සතුන්ගේ භෝජන යන්ත්‍රණය දක්වන්න.

(a) මී මැස්සා - ....

(b) කොළ කන දළඹුවා - ....

(c) බැලීන් තල්මසා - ....

(v) රුධිර කැටි ගැසීම සඳහා අවශ්‍ය වන විටමිනයක් හා ඛනිජ පෝෂකයක් ලියන්න.

(a) විටමිනය - ....

(b) ඛනිජ පෝෂකය - ....

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

03. (A) (i) (a) සංවෘත සංසරණ පද්ධතියක් යනු කුමක් ද?

....

....

(b) අවයව වෙත රුධිරය සැපයීමේ දී ඒක සංසරණයට සාපේක්ෂව ද්විත්ව සංසරණය වඩා කාර්යක්ෂම වන්නේ ඇයි ?

....

....

(ii) (a) වැඩි හිමොග්ලොබීන් අණු ප්‍රමාණයක් අන්තර්ගත කර ගැනීම සඳහා වැදගත්වන මානව රක්තාණුවක ඇති ලක්ෂණ 2 ක් ලියන්න.

....

....

(b) රුධිර පාරවිලනයේ දී සර්ව ප්‍රතිග්‍රාහකයා වනුයේ කුමන රුධිර ගණයද?

....

(iii) සත්ව පරිනාමයේ දී ශ්වසන පෘෂ්ඨ පරිනාමය වීම අවශ්‍ය වුයේ ඇයි?

....

....

....

....

(iv) (a) ශ්වසන චක්‍රය යනු කුමක් ද?

....

(b) ''ව්‍යුහාත්මක මල අවකාශය'' ලෙස හඳුන්වනුයේ කුමක් ද?

....

....

(v) (a) නයිට්‍රජනීය බහිස්‍රාවී ඵලය ලෙස NH_3 බැහැර කිරීමේ දී ජීවියාට ලැබෙන වාසියක් ලියන්න.

....

(b) අතිපරිස්‍රාවණය කාර්යක්ෂම කර ගැනිමට ගැච්ඡිකාවේ ඇති ව්‍යුහමය ලක්ෂණයක් ලියන්න.

....

(B) (i) (a) මස්තිෂ්ක සුංශුම්නා තරලයේ කෘත්‍ය 2 ක් ලියන්න.

....

....

(b) අනස්සව කාලයේ වැදගත්කම ලියන්න.

....

(c) මිනිසාගේ කනේ ඇති ධ්වනි කම්පන හඳුනා ගැනීමට වැදගත්වන ව්‍යුහය කුමක් ද?

....

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(ii) (a) දෘෂ්ටික සංවේදනයේ දී යෂ්ටි සෛල හා කේතු සෛල වල දායකත්වයේ වෙනස්කමක් ලියන්න.

....

....

(b) හයිපොතැලමස මඟින් සංශ්ලේෂණය කරන පූර්ව පිටියුටරිය මත ක්‍රියා නොකරන හෝමෝනයක් ලියන්න.

....

(c) වැඩි දේහ උෂ්ණත්වයේ දී මානව සමෙහි වන වෙනස් වීමක් ලියන්න.

....

....

(iii) මානව ශුක්‍රාණු ජනනයේ පියවර පහත දැක්වේ.



(a) p, q, r හා s ලෙස දක්වා ඇති අවස්ථා ලියන්න.

p - ....

q - ....

r - ....

s - ....

(b) x ක්‍රියාවලිය කුමක් ද?

....

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(iv) (a) මානව කලල බන්දය මගින් නිපදවන හෝමෝනයක් ලියන්න.

....

(b) ගබ්සා කිරීම යනු කුමක් ද?

....

....

(c) ලිංගිකව සම්ප්‍රේෂණය වන වෛරස ආසාදිත රෝගයක් ලියන්න.

....

(v) (a) ශංකබ අස්ථියේ හමු වන ප්‍රසරයක් ලියන්න.

....

(b) කංකාල පේශි සංකෝචනයේ දී ප්‍රධාන කාර්යයක් ඉටු කරන අයණය කුමක් ද?

....

(C) (i) (a) මෙන්ඩල්ගේ ස්වාධීන සංරචක නියමය වලංගු වන අවස්ථාවක් ලියන්න.

....

(b) පහත අවේනික රටා හඳුනා ගන්න.

- තනි ජානයක් මඟින් රූපානුදර්ශ කීපයක් ඇති කිරීම.

  ....

- ජානයක ඇලීල යුගලකට වඩා පැවතීම.

  ....

(c) ශාක හා සත්ව අභිජනනයේ දී භාවිතා කරන ප්‍රවේනි විද්‍යාත්මක මූලධර්මයක් ලියන්න.

....

(ii) (a) DNA ප්‍රතිවලිතයේ දී හෙලිකේස් එන්සයිමයේ කාර්යය ලියන්න.

....

(b) ප්‍රතිලේඛනය යන්න හඳුන්වන්න.

....

(iii) DNA ඒෂණ සලකුණු කිරීමට භාවිතා කල හැකි ක්‍රමයක් ලියන්න.

....

(iv) පොලිමරේස් දාම ප්‍රතික්‍රියාවේ තාපජ චක්‍රයක පියවර අනුපිළිවෙලින් ලියන්න.

....

....

....

04. (A) (i) (a) භෝග අස්වැන්න වැඩි කිරීමෙහිලා ජාන තාක්ෂණයෙන් ලැබුනු දායකත්වයන් 2 ක් ලියන්න.

....

....

(b) ප්‍රවේණිකව විකරණය කල ජීවීන්ගෙන් ජෛව විවිධත්වය ආරක්ෂා කර ගැනීමට ඇති කරගත් අන්තර්ජාතික එකඟතාවය කුමක් ද?

....

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(ii) (a) පරිසර පද්ධතියක් යනු කුමක් ද?

....

(b) පරිසර පද්ධතියක අජෛව – අජෛව අන්තර්ක්‍රියාවකට උදාහරණයක් දෙන්න.

....

(c) උඩුකුරු මෙන්ම යටිකුරු ද විය හැකි පාරිසරික පිරමිඩ ආකාරයක් ලියන්න.

....

(iii) නිවර්තන කලාපයේ හමුවන බියෝම 2 ක් ලියන්න.

....

....

(iv) (a) ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති වර්ගකර දක්වන්න.

....

....

....

(b) ''පීට්'' යනු මොනවා ද?

....

(c) සූර්යයාලෝකයෙන් ආරක්ෂා වීමට කඩොලාන ශාක පත්‍ර පෙන්වන අනුවර්තනයක් ලියන්න.

....

(B) (i) ජෛව විවිධත්වයේ සංරචක තුන ලියන්න.

....

....

....

(ii) පහත තර්ජන මට්ටම් වලට අයත් ජීවියෙකුට උදාහරණයක් බැගින් ලියන්න.

(a) අන්තරායට ලක් විය හැකි - ....

(b) අන්තරායට ලක් වූ - ....

(c) අතිශය අන්තරායට ලක් වූ - ....

(iii) ගෝලීය උණුසුම හා දේශගුණික විපර්යාස වල බලපෑම් 3 ක් ලියන්න.

....

....

....

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(iv) (a) N_2 තිර කිරීම ලෙස හඳුන්වනුයේ කුමක් ද?

....

(b) නිදැලි වාසී / නිදහස් වාසී N_2 තිර කරන බැක්ටීරියා ගණනයක් ලියන්න.

....

(v) වෛරස වල සමමිතික ආකාර ලියන්න.

....

....

(C) (i) පහත ජීවානුහරණ ක්‍රම වලදී භාවිතා කරන තත්ව ලියන්න.

(a) පීඩතාපකය භාවිතයේ දී ....

....

(b) අධි උෂ්ණත්ව කෙටි කාලීන පැස්ටරීකරණය ....

....

(ii) මුදවපු කිරි තුනී අඳුනක් ලෙස පතුරවන ලද වීදුරු කඳාවක් සපයා ඇති නම්, සරල වර්ණකයක් භාවිතයෙන් එහි සිටින බැක්ටීරියාවන් වර්ණ ගැන්වීමේ පියවර නිවැරදි අනුපිළිවෙලින් ලියන්න.

....

....

....

....

....

(iii) බීජයක් ප්‍රරෝහනය ආරම්භ කිරීමට අවශ්‍ය වන තත්ව ලියන්න.

....

....

....

(iv) ප්‍රජාවක් තුල බරවා රෝගසම්ප්‍රේෂණයට බලපාන සාධක 2 ක් ලියන්න.

....

....

(v) මානව කලල මුලික සෛල වල දක්නට ලැබෙන විභේදනය නොවූ ප්‍රධාන ලක්ෂණයක් ලියන්න.

....

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(B) කොටස - රචනා

- **ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **අවශ්‍ය තැන්හිදී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.**
  (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 150 කි.)

05 **(a)** ජලය සතු ප්‍රධාන ගුණාංග ජීවය පවත්වා ගැනීමට වැදගත් වන ආකාරය විස්තර කරන්න.

(b) ප්‍රෝටීන වල තැනුම් ඒකක අණුවේ රසායනික සංයුතිය පැහැදිලි කරන්න.

06. **(a)** කොන්ඩ්‍රික්තියේස් හා ඔක්ටික්තියේස් වර්ග එකිනෙක වෙන්කර හඳුනා ගන්නා අයුරු කෙටියෙන් විස්තර කරන්න.

(b) ශාක දේහය තුල ජලය හා ද්‍රාව්‍ය පරිවහනය වන ක්‍රම විස්තර කරන්න.

07. පරිචිත ප්‍රතිශක්තියේ දී වසා සෛල වල කාර්යයභාරය සාකච්ඡා කරන්න.

08. **(a)** ග්‍රහනයට, බර ඉසිලීමට හා පුළුල් පරාසයක චලන සඳහා මානව පූර්ව ගාත්‍රය පෙන්වන අනුවර්තන විස්තර කරන්න.

(b) උදාහරණයක් ඇසුරෙන් ''අසම්පූර්ණ ප්‍රමුඛතාවය'' පැහැදිලි කරන්න.

09. **(a)** ප්‍රවේනි කේතයේ ලක්ෂණ පහදන්න.

(b) නාගරික පානීය ජලය පිරිපහදු පිරියතක ජලය පිරියම් කිරීමේ පියවර කෙටියෙන් විස්තර කරන්න.

10. කෙටි සටහන් ලියන්න.

(a) කඩොලාන පරිසර පද්ධති

(b) මානව මස්තිෂ්කයේ ව්‍යුහය

(c) පටක රෝපන ශිල්ප ක්‍රමයේ වැදගත්කම

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

අ.පො.ස (උ.පෙළ) විභාගය/க. பொ.த. (உ.தர)ப் பரீட்சை / G.C.E (A/L)

බහුවරණ උත්තර පත්‍රය/ M.C.Q Answer Sheet

විෂය හා විෂය අංකය
Subject and Subject No.

Biology — Grad 13 3rd Term Test, Sabaragamuwa Province -

විභාග අංකය
Index No.

